# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2264/18 – 2022 ජනවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා – 2022.01.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (x).

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23අ වගන්තිය යටතේ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පරිසර අමාත්‍ය මහින්ද අමරවීර වන මම, මේ නියමය මගින්, පරිසරය දූෂණය කරමින් පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ මෝචනය කිරීම කෙරෙන කටයුතු හෝ එවැනි ප්‍රතිඵලයක් ඇති කෙරෙන කටයුතු වන්නා වූ මෙහි උපලේඛනයේ දක්වා ඇති කටයුතු, ඉහත කී වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත කටයුතු ලෙස නිශ්චය කරමි.

මහින්ද අමරවීර,
පරිසර අමාත්‍ය.

2022 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

1A – PG5737 – 10,010 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍යවන නියමිත කටයුතු

### "අ" කොටස

1. රසායනික ද්‍රව්‍ය/ පොහොර/ පලිබෝධ නාශක (කෘමිනාශක, දිලීරනාශක, වල්නාශක යනාදිය) නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

2. දෛනික නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 1000ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්වන සබන්, ක්ෂාලක ද්‍රව්‍ය, මෘදුකාරක හෝ වෙනත් පිරිසිදුකාරක ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත.

3. කෘතිම රබර්, ස්වභාවික රබර්, නිෂ්පාදනය කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ හෝ රබර් පාදක කරගත් කර්මාන්ත සහ දෛනික නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 100ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්වන දුම්ගැසූ දාර රබර් රොටි නිෂ්පාදන කර්මාන්ත.

4. තෙල් (ඛණිජතෙල් හෝ පෙට්‍රෝලියම්) පිරිපහදු.

5. ගබඩා ධාරිතාවය ටොන් 5000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්වන ගල්අඟුරු ගබඩා කිරීමේ අංගන හෝ ගල්අඟුරු පාදක කරගත් රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ පිරිසැකසුම් කිරීමේ නිරත කර්මාන්ත.

6. සක්‍රිය කාබන් හෝ කාබන් කුඩු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

7. වර්ණක සහ වර්ණක අතරමැදි ඵල නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

8. සායම් (ඉමල්ෂන් හෝ එනැමල්) තීන්ත, වර්ණක, වාර්නිෂ්, පොලිෂ් වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

9. ඛනිජතෙල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය (මූලික හෝ අතරමැදි ඵල) නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

10. කාර්මික වායු නිෂ්පාදනය කිරීමේ, පිරිසැකසුම් කිරීමේ හෝ නැවත පිරවීමේ කර්මාන්ත.

11. තාර මිශ්‍රණ (ඇස්පෝල්ට්) යන්ත්‍රාගාර.

12. සියලුම වර්ගයේ ටයර් හෝ ටියුබ් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

13. බැටරි නිෂ්පාදනය කිරීමේ හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්ත.

14. ඇස්බැස්ටස් කෙඳි අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කරන කර්මාන්ත.

15. රෙදිපිළි පිරිසැකසුම් කිරීමේ (විරංජන කිරීම, වර්ණ ගැන්වීම, මුද්‍රණය කිරීම ඇතුලුව) කර්මාන්ත හෝ ඇඟලුම් සේදීමේ කර්මාන්ත හෝ වැලි උපයෝගී කොටගෙන රෙදිපිළි පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත.

16. තෙත් ක්‍රියාවලි සහිත සම් පිරිසැකසුම් කිරීමේ හෝ සම් පදම් කිරීමේ කර්මාන්ත හෝ නිමවුම් කිරීමේ කර්මාන්ත.

17. මධ්‍යසාර පැසවීමේ කර්මාන්ත (ස්කාගාර, බීර නිෂ්පාදනාගාර යනාදිය).

18. ක්ෂණික තේ හෝ කෝපි පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත.

19. ඉලෙක්ට්‍රොප්ලේටින් සහ ගැල්වනයිස් කිරීමේ කර්මාන්ත ද ඇතුලුව ලෝහ හෝ ප්ලාස්ටික් පෘෂ්ට පිරියම් කිරීමේ කර්මාන්ත හෝ පවුඩර් කෝටින් කරන කර්මාන්ත.

20. කම්මල් හැර යකඩ හා වානේ කර්මාන්ත.

21. ද්විතීයික ක්‍රියාවලි, උණු කිරීම සහ ලෝහ නැවත ලබාගැනීම සහිත යකඩ නොවන ලෝහ සැකසීමේ හෝ නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

22. සිමෙන්ති කර්මාන්ත (ක්ලින්කර් ඇඹරුම් හෝ නිෂ්පාදනය කිරීමේ හෝ නැවත ඇසිරීමේ).

23. වීදුරු ද්‍රවීකෘත කිරීම සහිත වීදුරු නිෂ්පාදන කර්මාන්ත.

24. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්ත පිඟන් මැටි කර්මාන්ත.

25. වරකට බෝර වලවල් එකකට වඩා වැඩි සංඛ්‍යාවක් පිපිරවීම සිදු කරන යාන්ත්‍රික කැණීම්.

26. මෝටර් රථ, ත්‍රිරෝද රථ හෝ මෝටර් බයිසිකල් හෝ බයිසිකල් නිෂ්පාදන කර්මාන්ත.

27. ජල හෝ සූර්ය හෝ සුළං විදුලි නිෂ්පාදන බලාගාර සහ පොදු විදුලි බිඳවැටීම්වල දී පමණක් භාවිත කරන විදුලි ජනක හැර විදුලිය නිෂ්පාදනය කිරීමේ ඒකක.

28. අතින් තැනූ කඩදාසි සහ කඩදාසි පාදක කරගත් සැරසිලි භාණ්ඩ හැර කඩදාසි සහ පල්ප නිෂ්පාදන කර්මාන්ත.

29. කර්මාන්ත කලාප, කර්මාන්තපුර, අපනයන සැකසුම් කලාපවලින් පිටත හෝ ඒ තුළ පිහිටි පොදු අපද්‍රව්‍ය පිරිපහදු කළමනාකරණ පද්ධති.

30. යාන්ත්‍රිකව මලකඩ ඉවත් කිරීම ඇතුලුව නැව් අලුත්වැඩියා කිරීමේ කර්මාන්ත සහ නැව් තැනීමේ කර්මාන්ත.

31. ධීවර වරායන් හැර සියලු වරායන්.

32. සියලු ජාත්‍යන්තර ගුවන් තොටුපලවල්.

33. නිෂ්පාදන ක්‍රියාවලියේ දී දිනකට ඝන මීටර් 40ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අපජලය බැහැර කරන මේ උපලේඛනයේ "අ" කොටසේ ඇතුළත් නොවන ක්‍රියාකාරකම්/කර්මාන්ත.

## "ආ" කොටස

1. රසායනික ද්‍රව්‍ය/පොහොර/ පලිබෝධනාශක (කෘමිනාශක, දිලීරනාශක, වල්නාශක) යනාදිය නැවත ඇසුරුම් කිරීමේ කර්මාන්ත හෝ වාණිජ කාර්ය සඳහා රසායනික ද්‍රව්‍ය/ පොහොර/ පලිබෝධනාශක (කෘමිනාශක, දිලීරනාශක, වල්නාශක) යනාදිය තොග ගබඩා.

2. ඒකාබද්ධ ධාරිතාව මෙට්‍රික් ටොන් 150ක් හෝ ඊට වැඩි පෙට්‍රෝලියම් ද්‍රව හෝ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (එල්.පී. වායු) තොග ගබඩා හෝ පෙට්‍රෝලියම් ද්‍රව පිරවුම්හල් සහ සියලුම ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (එල්.පී. වායු) පිරවුම්හල්.

3. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි ගණනක් සේවයේ නියැලි සිටින අමුද්‍රව්‍ය වශයෙන් ෆයිබර් ග්ලාස් භාවිත කිරීමේ කර්මාන්ත.

4. එක් තොගයකට මෙට්‍රික් ටොන් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක නිෂ්පාදන ධාරිතාවයක් සහිත අඟුරු නිෂ්පාදන කර්මාන්ත.

5. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආයුර්වේද හෝ දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ නියැලී සිටින කර්මාන්ත.

6. කාර්මික වායු ගබඩා.

7. බහු අවයවික (පොලිමර්) නිෂ්පාදනය කිරීමේ හෝ බහුඅවයවික (පොලිමර්) ආශ්‍රිත නිෂ්පාදන (එනම් පොලිඑතිලීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (පී.වී.සී.), පොලියුරතීන්, පොලිප්‍රොපිලීන්, පොලියෙස්ටර්, නයිලෝන්, පොලිස්ටයිරීන්, රෙසින්, ෆයිබර් ග්ලාස් හෝ වෙනත් කෘතිම කෙඳි වර්ග යනාදිය) නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

8. ටයර් නැවත පිරවීමේ හෝ නැවත සැකසීමේ කර්මාන්ත.

9. ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 500 ක් හෝ ඊට වැඩි සහ මෙට්‍රික් ටොන් 5000 ක් හෝ ඊට අඩු ගල් අඟුරු ගබඩාංගන.

10. (ආයුර්වේද සහ දේශීය ඖෂධ හැර) ඖෂධ අතරමැදි ඵල ඇතුලුව බටහිර ඖෂධ හෝ විලවුන් නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

11. ස්වභාවික ගම් හැර ඇලවෙන සුළු ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හෝ නැවත ඇසුරුම් කිරීමේ කර්මාන්ත.

12. පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත හෝ ගිනිකූරු නිෂ්පාදන කර්මාන්ත.

13. මසකට පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑ. 1000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිත කරන රතිඤ්ඤා ඇතුලු ගිණිකෙළි නිෂ්පාදන කර්මාන්ත.

14. ක්ෂාලක ද්‍රව්‍ය හෝ වෙනත් රසායනික ද්‍රව්‍ය භාවිත කරන වාණිජ මට්ටමේ බෝතල් සේදීමේ කර්මාන්ත.

15. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන බතික් කර්මාන්ත.

16. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන හෝ ඇඳුම් පිරිසිදු කිරීමේ ධාරිතාවය දිනකට කි.ග්‍රෑ. 50 කට (වියළි ඇඳුම්) වැඩි වාණිජ මට්ටමේ ඇඳුම් පිරිසිදු කිරීමේ කර්මාන්ත (ලොන්ඩරි).

17. ස්වභාවික කෙඳි පිරිසැකසුම් කිරීමේ, විරංජනය කිරීමේ හෝ වර්ණ ගැන්වීමේ කර්මාන්ත හෝ සේවකයින් 25ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන ස්වභාවික කෙඳි ආශ්‍රිත කර්මාන්ත.

18. යන්ත්‍ර 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇති බලවේග පෙහෙකම්හල් හෝ කැඳ දැමීමේ ක්‍රියාවලිය සහිත බලවේග පෙහෙකම්හල්.

19. සීනි නිෂ්පාදන හෝ සීනි  පිරිපහදු කර්මාන්ත.

20. මධ්‍යසාර අඩංගු බීම නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් කිරීමේ කර්මාන්ත.

21. සේවක සංඛ්‍යාව 50ක් හෝ ඊට වඩා සේවයේ යොදවන සිගරැට් හෝ දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

22. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වඩා සේවයේ යොදවන ආහාර නිෂ්පාදන හෝ සැකසීමේ කර්මාන්ත.

23. පිටි කිලෝ ග්‍රෑම් 1000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දෛනික යෙදවුම් ධාරිතාවක් සහිත බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත.

24. මස් පිණිස සතුන් මරණ ස්ථාන හෝ වාණිජ මට්ටමේ මස් සැකසීමේ කර්මාන්ත.

25. දෛනික නිෂ්පාදන ධාරිතාවය ලීටර් 1000ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.

26. පොල්තෙල් සිඳීමේ කර්මාන්ත හෝ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 30ක් හෝ ඊට වැඩි අනෙකුත් ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

27. නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 30ක් හෝ ඊට වැඩි සත්ව තෙල්/මේද නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

28. නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 500ක් හෝ ඊට වැඩි මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් කිරීමේ කර්මාන්ත.

29. දිසිදි පොල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ පොල් සැකසීමේ කර්මාන්ත.

30. වී පෙගවීමේ ක්‍රියාවලිය සහිත දිනකට කිලෝ ග්‍රෑම් 5000ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වී මෝල්.

31. දිනකට කිකිළි බිත්තර 500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බිත්තර රක්කවන ස්ථාන.

32. ඕනෑම විටක දී වැඩුණු පක්ෂීන් 2500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇති කුකුළු ගොවිපලවල්.

33. ඕනෑම විටක දී වැඩුණු සතුන් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇති ඌරු හෝ ගව ගොවිපලවල්.

34. ඕනෑම විටක දී වැඩුණු සතුන් 250ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇති එළු ගොවිපලවල්.

35. ඕනෑම විටක දී ඇති මුළු වැඩුණු සතුන් සංඛ්‍යාව 2500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන මිශ්‍ර ගොවිපලවල්. *

* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]

36. දෛනික නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 25ක් හෝ ඊට වැඩි සත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

37. සේවක සංඛ්‍යාව 5ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන උඳුන් සහිත වාත්තු කර්මාන්ත.

38. ලෝහ සංස්කාර්ය කර්මාන්ත හෝ යන්ත්‍රෝපකරණ, යන්ත්‍රෝපකරණ කොටස් හෝ ලෝහ භාණ්ඩ, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ සහ උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ එකලස් කිරීමේ කර්මාන්ත.

39. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ කර්මාන්ත.

40. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන ලියවන පට්ටල් හෝ වෑල්ඩින් වැඩපලවල් හෝ විසිරි පින්තාරු සිදු කරන කර්මාන්ත.

41. දිනකට ඝනමීටර් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන නිෂ්පාදන ධාරිතාවයක් සහිත කොන්ක්‍රීට් පූර්ව මිශ්‍රණ යන්ත්‍රාගාර.

42. වරකට එක් බෝර වලක් බැගින් පිපිරවීම සිදුකරන මාසික නිෂ්පාදන ධාරිතාවය ඝනමීටර් 500ක් හෝ ඊට වැඩි යාන්ත්‍රික කැණීම්.

43. බෙලිකටු සහ කළුගල් ඇඹරීමේ කර්මාන්ත හැර ලෝහමය නොවන ඛණිජ (එනම් හුණුගල්, ඩොලමයිට්, ඇපටයිට්, රොක්පොස්පේට්, වැලිගල්, පෙල්ඩ්ස්පාර්, ක්වාර්ට්ස්, ඉල්මනයිට්, රූටයිල්, සර්කොන්, මයිකා, තලාතු මිනිරන්, පිඟන් මැටි යනාදිය) ඇඹරීම හෝ සැකසීම සිදු කරන කර්මාන්ත.

44. කුට්ටි කළුගල් සෑදීම හෝ පිරිසැකසුම් කර්මාන්ත (පොළවෙන් ගැලවීම, පිපිරීම, කැබලි කිරීම, ඔපදැමීම).

45. දිනකට ඝන මීටර් 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක නිෂ්පාදන ධාරිතාවක් ඇති කළුගල් ඇඹරීමේ කර්මාන්ත.

46. අපසන්දන (කාර්මික හෝ මළ) පොදු පිරිපහදු පද්ධති.

47. දිනකට මෙට්‍රික් ටොන් 5ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යෙදවුම් ධාරිතාවක් ඇති දාහක.

48. දිනකට ඝනමීටර් 10,000ක් හෝ ඊට වැඩි පිරිපහදු ධාරිතාවයක් ඇති පානීය ජල පිරිපහදු පද්ධති.

49. දෛනික යෙදවුම් ධාරිතාවය මෙට්‍රික් ටොන් 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන නාගරික හා අනෙකුත් ඝන අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදන සිදුකරන ස්ථාන.

50. දෛනික යෙදවුම් ධාරිතාවය මෙට්‍රික් ටොන් 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය (ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඇතුලුව) හෝ නැවත ලබා ගැනීමේ හෝ සැකසීමේ කර්මාන්ත.

51. දිනකට මෙට්‍රික් ටොන් 10ක් හෝ ඊට වැඩි බැහැර කිරීමේ ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් හෝ ස්ථාන.

52. සියලුම විෂ සහිත සහ උපලේඛනගත අපද්‍රව්‍ය බැහැර කිරීමේ හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ හෝ නැවත ලබා ගැනීමේ හෝ ගබඩා කිරීමේ පහසුකම්.

53. බෝරෝන් පිරියම් ක්‍රමය හැර දැව වර්ග රසායනික පිරියම් කිරීමේ හා ආරක්ෂණයේ නියුතු කර්මාන්ත.

54. දිනකට ඝනමීටර් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හෝ සේවකයින් 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවයේ යොදවන දැව ආශ්‍රිත කර්මාන්ත.

55. සියළුම තුනී ලැලි නිෂ්පාදන කර්මාන්ත.

56. කාමර සංඛ්‍යාව 20ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් ඇති නේවාසික පහසුකම් සහිත හෝටල් හෝ ආපනශාලා හෝ ආගන්තුක නිවාස හෝ තානායම්.

57. සේවක පිරිස 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවයේ යොදවන නේවාසික පහසුකම් නොමැති හෝටල් හෝ ආපනශාලා හෝ සේවක පිරිස 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවයේ යොදවන උත්සවශාලා හෝ ආහාර සැකසුම් ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.

58. දෛනික නේවාසිකයන් සංඛ්‍යාව 200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.

59. වෛද්‍ය රසායනාගාර හෝ රෝහල් හෝ වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථාන.

60. මෝටර් රථ හෝ ත්‍රිරෝද රථ හෝ යතුරුපැදි හෝ පාපැදි එකලස් කිරීමේ කර්මාන්ත.

61. ත්‍රිරෝද රථ සහ යතුරුපැදි සේවා කටයුතු සහ අභ්‍යන්තර පිරිසිදුකිරීම් හැර වාහන සේවා ක්‍රියාකාරකම් සහිත වාහන සේවා ස්ථාන හෝ වාහන සේවා කටයුතු සිදුකරන බහලුම් පර්යන්ත.

62. වාහන සේවා කටයුතු සිදුකරන සියලුම බස් ඩිපෝ හෝ දුම්රිය අංගන හෝ ගුවන්යානා නඩත්තු අංගන.

63. වාහනවලින් පිටවන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන.

64. මෙගාවොට් 3 හෝ ඊට වැඩි දළ විදුලි උත්පාදන ධාරිතාවයක් ඇති සියලුම ජල විදුලි බලාගාර හෝ සුළං විදුලි බලාගාර.

65. ඊයම් උණුකිරීම සහිත මුද්‍රණාල හෝ පුවත්පත් මුද්‍රණාල හෝ අපජලය ජනනය වන ක්‍රියාකාරකම් සහිත මුද්‍රණාල.

66. කඩදාසි නිෂ්පාදන කර්මාන්ත හෝ රැලි සහිත කාඩ්බෝඩ් නිෂ්පාදන කර්මාන්ත.

67. සත්වෝද්‍යාන හෝ සත්ව රෝහල් හෝ සතුන් ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන.

68. විදුලි සංදේශනය හෝ රූපවාහිනී හෝ ගුවන් විදුලි සේවා සඳහා පහසුකම් සපයන සම්ප්‍රේෂණ කුළුණු.

69. පලිබෝධ මර්දන සේවා.

70. එක් වැඩමුරයක් සඳහා සේවක සංඛ්‍යාව 200ක් හෝ ඊට වඩා සේවයේ යොදවන මේ උපලේඛනයේ "ආ" කොටසට ඇතුළත් නොවන යම් කටයුත්තක්/ කර්මාන්තයක්.

71. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දිනකට අපජලය ඝන මීටර් 10ක් හෝ ඊට වැඩි සහ ඝන මීටර් 40 කට අඩු ධාරිතාවයකින් බැහැර කරන මේ උපලේඛනයේ "ආ"කොටසට ඇතුළත් නොවන යම් කටයුත්තක්/ කර්මාන්තයක්.

## "ඇ" කොටස

1. දිනකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත සබන්, ක්ෂාලක ද්‍රව්‍ය, මෘදුකාරක හෝ වෙනත් පිරිසිදුකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

2. ඒකාබද්ධ ගබඩා ධාරිතාව මෙට්‍රික් ටොන් 150කට වඩා අඩු පෙට්‍රෝලියම් ද්‍රව තොග ගබඩා හෝ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (එල් පී වායු) ගබඩා හෝ වාහන ඉන්ධන පිරවුම්හල් ඇතුළු පෙට්‍රෝලියම් ද්‍රව පිරවුම්හල්.

3. මසකට පුපුරණ ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1000 කට අඩු සහ කිලෝග්‍රෑම් 200කට වැඩි ප්‍රමාණයක් භාවිත කරන රතිඤ්ඤා ඇතුලු ගිණිකෙළි නිෂ්පාදන කර්මාන්ත.

4. සේවක සංඛ්‍යාව 10 කට අඩු ගණනක් සේවයේ යොදවන අමුද්‍රව්‍ය වශයෙන් ෆයිබර් ග්ලාස් භාවිතා කිරීමේ කර්මාන්ත.

5. දෛනික නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ කිලෝග්‍රෑම් 100ට අඩු දුම් ගැසූ දාර රබර් රොටී නිෂ්පාදනය කරන කර්මාන්ත.

6. එක් තොගයකට කිලෝග්‍රෑම් 250ක් හෝ ඊට වැඩි සහ මෙට්‍රික් ටොන් එකකට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත අඟුරු නිෂ්පාදනය කරන කර්මාන්ත.

7. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි ගණනක් සහ 25 කට අඩු ගණනක් සේවයේ යොදවන ආයුර්වේද හෝ දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ නියැලී සිටින කර්මාන්ත.

8. සේවක සංඛ්‍යාව 5ක් හෝ ඊට වැඩි ගණනක් සහ 10 කට අඩු ගණනක් සේවයේ යොදවන වාණිජ මට්ටමේ බතික් කර්මාන්ත.

9. සේවක සංඛ්‍යාව 5ක් හෝ ඊට වැඩි ගණනක් සහ 10 කට අඩු ගණනක් සේවයේ යොදවන හෝ දෛනික ඇඳුම් පිරිසිදු කිරීමේ ධාරිතාවය කිලෝග්‍රෑම් 50 කට (වියළි ඇඳුම්) අඩු වාණිජ මට්ටමේ ඇඳුම් පිරිසිදු කිරීමේ කර්මාන්ත. (ලොන්ඩරි)

10. වියලි ක්‍රියාවලි සහිත සම් පිරිසැකසුම් කිරීමේ හෝ නිමවුම් කිරීමේ කර්මාන්ත.

11. සේවක සංඛ්‍යාව 5ක් හෝ ඊට වැඩි ගණනක් සහ 25 කට අඩු ගණනක් සේවයේ යොදවන ස්වාභාවික කෙඳි හෝ කොහු ආශ්‍රිත කර්මාන්ත (කොහු වියළීම, කුට්ටි කිරීම යනාදිය).

12. යන්ත්‍ර 5ක් හෝ ඊට වැඩි ගණනක් සහ 25 කට අඩු ගණනක් ඇති බලවේග පෙහෙකම්හල් (කැඳ දැමීමේ ක්‍රියාවලිය රහිත)

13. සීනි නිෂ්පාදන කර්මාන්ත හෝ සීනි පිරිපහදු කර්මාන්ත හෝ ගෘහස්ථ උක් ආශ්‍රිත කර්මාන්ත හැර වාණිජ මට්ටමේ උක් ආශ්‍රිත කර්මාන්ත.

14. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩි ගණනක් සහ 50කට අඩු ගණනක් සේවයේ යොදවන සිගරැට් හෝ දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

15. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි ගණනක් සහ 25 කට අඩු ගණනක් සේවයේ යොදවන ආහාර නිෂ්පාදන හා සැකසීමේ කර්මාන්ත.

16. පිටි කිලෝග්‍රෑම් 250ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක සහ පිටි කිලෝග්‍රෑම් 1000 කට අඩු ප්‍රමාණයක දෛනික යෙදවුම් ධාරිතාවයක් සහිත බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත.

17. වී පෙඟවීමේ ක්‍රියාවලිය සහිත දිනකට කිලෝග්‍රෑම් 5000 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වී මෝල්.

18. මසකට නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් 1000කට වැඩි ඇඹරුම්හල්.

19. නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 100ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ ලීටර් 500 කට අඩු ප්‍රමාණයක් වන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්ත.

20. දෛනික නිෂ්පාදන ධාරිතාවය ලීටර් 200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ ලීටර් 1000 කට අඩු ප්‍රමාණයක් වන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.

21. පොල්තෙල් සිඳීමේ කර්මාන්ත හෝ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ ලීටර් 30 කට අඩු ප්‍රමාණයක් වන අනෙකුත් වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

22. කිකිළි බිත්තර 200 ක් හෝ ඊට වැඩි ගණනක් සහ 500 කට අඩු ගණනක් රක්කවන ස්ථාන.

23. ඕනෑම විටකදී වැඩුණු පක්ෂීන් 500ක් හෝ ඊට වැඩි ගණනක් සහ 2500 කට අඩු ගණනක් ඇති කුකුළු ගොවිපලවල්.

24. ඕනෑම විටක දී වැඩුණු සතුන් 10ක් හෝ ඊට වැඩි ගණනක් සහ 50 කට අඩු ගණනක් ඇති ඌරු හෝ ගව ගොවිපලවල්.

25. ඕනෑම විටක දී වැඩුණු සතුන් 50ක් හෝ ඊට වැඩි ගණනක් සහ 250 කට අඩු ගණනක් ඇති එළු ගොවිපලවල්.

26. ඕනෑම විටක දී ඇති මුළු වැඩුණු සතුන් සංඛ්‍යාව 500ක් හෝ ඊට වැඩි ගණනක් සහ 2500කට අඩු ගණනක් වන මිශ්‍ර ගොවිපලවල්.*

* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]

27. සියලුම ජලජ සත්ව ගොවිපලවල් සහ මසුන් බෝ කරන ස්ථාන.

28. දෛනික නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 0.5ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ මෙට්‍රික් ටොන් 25 කට අඩු ප්‍රමාණයක් වන වාණිජ මට්ටමේ සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

29. නිෂ්පාදන ධාරිතාවය දිනකට ලීටර් 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ ලීටර් 30කට අඩු ප්‍රමාණයක් වන සත්ව තෙල්/ මේද නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

30. බර අනුව දිනකට මෙට්‍රික් ටොන් 5 කට අඩු උපරිම යෙදවුම් ධාරිතාවයක් ඇති දාහක.

31. ක්ෂණික තේ නිෂ්පාදනය කිරීමේ සහ මිශ්‍ර කිරීමේ කර්මාන්ත හැර අනෙකුත් තේ කර්මාන්තශාලා.

32. දිනකට ඝන මීටර් 2000ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට සහ ඝන මීටර් 10,000 කට අඩු ප්‍රමාණයක පිරිපහදු ධාරිතාවයක් ඇති පානීය ජලය පිරිපහදු පද්ධති.

33. සියළුම අයිස් නිෂ්පාදනාගාර.

34. දිනකට ඝන මීටර් 50 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත කොන්ක්‍රීට් පූර්ව මිශ්‍රණාගාර.

35. වරකට එක් බෝර වලක් බැගින් පිපිරවීම් සිදු කරන මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 500කට අඩු යාන්ත්‍රික කැණීම්.

36. දිනකට ඝන මීටර් 25 කට අඩු මුළු නිෂ්පාදන ධාරිතාවක් සහිත යාන්ත්‍රිකව කළුගල් ඇඹරීමේ හෝ පිරිසැකසීමේ කර්මාන්ත.

37. එක් තොගයකට මෙට්‍රික් ටොන් 20ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු (කැණීම් කළ කොරල් හැර)

38. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

39. මෙට්‍රික් ටොන් 10ට අඩු දෛනික යෙදවුම් ධාරිතාවයක් සහිත නාගරික ඝන අපද්‍රව්‍ය සහ වෙනත් ඝන අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කිරීමේ කර්මාන්තශාලා (ගෘහාශ්‍රිත මට්ටමේ කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම් හැර)

40. මෙට්‍රික් ටොන් 10 කට අඩු දෛනික යෙදවුම් ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය (ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඇතුළුව) ප්‍රතිචක්‍රීකරණය කිරීමේ/ නැවත ලබා ගැනීමේ හෝ පිරිසැකසීමේ කර්මාන්තශාලා.

41. දිනකට මෙට්‍රික් ටොන් 10 කට අඩු බැහැර කිරීමේ ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් (ගෘහාශ්‍රිත පහසුකම් හැර).

42. උපරිම නේවාසිකයින් සංඛ්‍යාව 100 හෝ ඊට වැඩි සහ 200 ට අඩු නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.

43. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 20 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ හෝ ආහාර සැපයීමේ සේවා ස්ථාන.

44. කාමර සංඛ්‍යාව 5ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල් හෝ අවන්හල් හෝ ආගන්තුක නිවාස හෝ ගිමන්හල්.

45. විසිරි පින්තාරු හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, සවි කිරීමේ සහ නඩත්තු කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළුව වාහන අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ මධ්‍යස්ථාන.

46. සේවක සංඛ්‍යාව 25 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින විසිරි පින්තාරු කිරීමේ කර්මාන්ත හෝ සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ලියවන පට්ටල් වැඩපළවල් හෝ වෑල්ඩින් වැඩපළවල්.

47. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීමේ කර්මාන්ත.

48. ශීතකරණ සහ ගෘහාශ්‍රිත වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ, එකලස් කිරීමේ හෝ සවි කිරීමේ මධ්‍යස්ථාන.

49. වායු සමීකරණ යන්ත්‍රවලින් හෝ ශීතකරණවලින් ශීතකාරක නැවත ලබාගැනීමේ හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථාන.

50. ත්‍රිරෝද රථ හෝ යතුරු පැදි සේවා ස්ථාන හෝ වාණිජ මට්ටමේ වාහන සේදීමේ ස්ථාන.

51. සියලුම ධීවර වරායන්.

52. ආදාහනාගාර.

53. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින උදුන් සහිත වාත්තු කර්මාන්ත.

54. දිනකට ඝනමීටර් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.

55. එක් වැඩ මුරයකට සේවකයින් 50ක් හෝ ඊට වැඩි සහ 200ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින මෙම උපලේඛනයේ 'ඇ' කොටසේ ඇතුළත් නොවන යම් ක්‍රියාකාරකමක් හෝ කර්මාන්තයක්.

56. නිෂ්පාදන ක්‍රියාවලිය තුල දිනකට අපජලය ඝන මීටර් 3 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහ ඝන මීටර් 10 කට අඩු ප්‍රමාණයක ධාරිතාවයකින් බැහැර කරන මේ උපලේඛනයේ ''ඇ'' කොටසට ඇතුලත් නොවන යම් කටයුත්තක්/කර්මාන්තයක්.

## "ඇ" කොටස

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.

2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.

3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)

4. රෙදි වියන යන්ත්‍ර/ මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.

5. දිනකට ලීටර 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

6. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

7. දිනකට ලීටර් 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්ත.

8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.

9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.

10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.

11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.

12. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත.

13. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/ මුහුවම් කිරීමේ කර්මාන්ත.

14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.

15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.

16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්.

17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.

18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.

19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්.*

* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]

20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන.

21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.

22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.

24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්.

25. බෙලිකටු කැබලි කිරීමේ/ පතුරු කිරීමේ කර්මාන්ත.

26. උළු සහ ගඩොල් පෝරණු.

27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.

29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු.

30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.

31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත,

32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත.

33. සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.

35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.

36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත.

37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා.

39. මෙම උපලේඛනයේ "ඇ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/ කර්මාන්තයක්.

2008.01.25 දිනැති අංක 1533/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබුවා වූ ද, පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු වූ ද, නියම කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ගැසට් පත්‍රය පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 01 - 0261/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.